{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

10 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය :

විෂයය :- නර්තනය
පාසලේ නම :-
ඇතුළත්වීමේ අංකය :-

# පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (3) | 11 - (3) | 21 - (3) | 31 - (4) |
| 2 - (1) | 12 - (1) | 22 - (1) | 32 - (4) |
| 3 - (2) | 13 - (4) | 23 - (4) | 33 - (3) |
| 4 - (1) | 14 - (2) | 24 - (1) | 34 - (4) |
| 5 - (4) | 15 - (1) | 25 - (4) | 35 - (3) |
| 6 - (2) | 16 - (3) | 26 - (2) | 36 - (4) |
| 7 - (3) | 17 - (2) | 27 - (2) | 37 - (2) |
| 8 - (1) | 18 - (3) | 28 - (2) | 38 - (2) |
| 9 - (4) | 19 - (2) | 29 - (3) | 39 - (1) |
| 10 -(2) | 20 - (3) | 30 - (4) | 40 - (3) |

මුළු ලකුණු 1 × 40 = 40

## II කොටස

01.( i) චාමර (ii) සාත්වික (iii) "සීතාහරණ" (iv) 06
(v) පොකුරු බෙරය (vi) රොබට් නොක්ස් (vii) ^ ^ / (viii) සබරගමු
(ix) (අ) අංග රචනය (ආ) වෙස් මෝස්තර (x) (අ) කවිකාර (ආ) විනෝදය

.( i) සිට (viii) ලකුණු - 8 යි.
(ix) සිට (x) ලකුණු - 4 යි.
} 12 යි.

02. i.

| ^<br>1 2 | ^<br>1 2 | /<br>1 2 3 4 | ^<br>1 2 | ^<br>1 2 | /<br>1 2 3 4 |
|---|---|---|---|---|---|
| කු ද | ග ත | ග ත දොමි - | කු ද | ග ත | ග ත දොමි - |

විභාග දැක්වීම හා සංකේත භාවිතය ලකුණු 02
බෙර පද ප්‍රස්ථාර කිරීමට ලකුණු 02
මුළු ලකුණු = 04

ii.

| /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 | /<br>1 2 3 4 |
|---|---|---|---|
| + පෙ රත් ක | ලෙ ක සිං හ | - ර ජෙක් වැ | ටු නි ම හ |
| + ලි ඳක් තු | ල ක ඉ බි | - ල ඬෙක් ක | ර පු වැ ඩ |

විභාග දැක්වීම හා සංකේත භාවිතය ලකුණු 02
බෙර පද ප්‍රස්ථාර කිරීමට ලකුණු 02
මුළු ලකුණු = 04

iii.

| ∧ 1 | 2 | / 1 | 2 | 3 | 4 | ∧ 1 | 2 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජෙං | - | තත් | - | තත් | - | ජෙං | - | තත් | - | තත් | - |
| ජෙං | - | තත් | - | තත් | - | ජෙං | - | තා | | | |
| ජෙනු | - | තත් | - | තත් | - | ජෙනු | - | තත් | - | තත් | - |
| ජෙනු | - | තත් | - | තත් | - | ජෙනු | - | තා | | | |
| ජෙං | - | ත ත් | - | තත් | - | ජෙං | - | තා | | | |
| ජෙනු | - | තත් | - | තත් | - | ජෙනු | - | තා | | | |
| ජෙං | - | තා | - | - | - | ජෙනු | - | තා | | | |
| දොහො | කඩ | තා | - | - | - | දොහො | කඩ | ග | ත | කු | ද |
| දොහො | කඩ | තා | - | - | - | | | | | | |

විභාග දැක්වීම හා සංකේත භාවිතය ලකුණු 02
බෙර පද ප්‍රස්ථාර කිරීමට ලකුණු 02
ලකුණු = 04
මුළු ලකුණු (4×3) = 12

03. i. අංගරචනය

- අංග රචනය - සරල අංගරචනය හා චරිතාංග අංග රචනය යනුවෙන් කොටස් දෙකක් බව
- නිර්මාණ කාර්යයේදී ස්වභාවිකත්වය ඉක්මවා ඒ ඒ චරිත සඳහා අංග රචනය සිදු වන බව
- අංග රචනය රංග කාර්යයේ දී සිදු වන බව
- අංග රචනා විධික්‍රම ඇති බව
- අංග රචනය සඳහා ද්‍රව්‍ය හා උපකරණ භාවිතයට ගන්නා බව
- ද්‍රව්‍ය හා උපකරණ සඳහන් කිරීම

කරුණු **හතරක්** ලියා තිබේ නම්, ලකුණු 04 යි.

ii ඔංචිලි වාරම්

- ඔංචිලි වර්ග ඇති බව (කතුරු, කැරකෙන, රෑහැන්, බඹර, කුඩු, වැල්)
- උවුරුදු කාලයේ ජනප්‍රිය ජන ක්‍රීඩාවක් බව
- විනෝදය අරමුණු කොට ඇති බව
- මේ තුලින් සාමුහිකත්වය, දරාගැනීම, අභියෝග වලට මුහුණ දීමේ හැකියාව වර්ධනය වන බව
- පත්තිනි දේවිය පිදීම ආදී වශයෙන් ලියා තිබීම
- ඔංචිලි වාරම් කවි විවිධ නාද මාලා අනුව ගායනා කරන බව
- උදාහරණ දක්වා තිබීම

කරුණු **හතරක්** ලියා තිබේ නම්, ලකුණු 04 යි.

iii. අණ බෙර

- රාජාඥාවක් දන්වා සිටීම සඳහා ජනතාව රැස් කර ගැනීමට මෙම විශේෂිත වූ බෙර පද කොටස වාදනය කරන බව
- මේ සඳහා දවුල යොදාගන්නා බව
- බෙර හඩ අසා රැස් වූ ජනතාවට රජුගේ ආඥාව ප්‍රකාශ කර සිටින බව
- දුටුගැමුණු රජු මහාසෑය බැඳීම සඳහා වඩුවන් රැස් කරවීමට අණ බෙර ගැසූ බව ථූපවංශයේ සඳහන් බව

කරුණු **හතරක්** ලියා තිබේ නම්, ලකුණු 04 යි.

iv ගැමි නැටුම්

- සෑම ජාතියකටම ඔවුන්ට ආවේණික ගැමිනැටුම් ඇති බව
- ගැමිනැටුම් වර්ග නම් කර තිබීම
- සරල චලන, සාමුහිකත්වය හා උපකරණ භාවිතයට ගන්නා බව
- සරල ගායනා, සරල රංගවස්ත්‍රාභරණ හා සරල වෙස් ගැන්වීම් ඇති බව
- ගැමිනැටුම් වලට අදාල කවි ඇති බව
- කවි මගින් උදාහරණ දැක්වීම
- ජීවන වෘත්තීන් හා විනෝදය පෙරදැරිව නිර්මාණය වී ඇති බව

කරුණු **හතරක්** ලියා තිබේ නම්, ලකුණු 04 යි.

v ගොඩ සරඹ

- උඩරට නර්තන සම්ප්‍රදායේ ගොඩසරඹ 12ක් සහ ඒ එකකට වෙන් වූ කස්තිරම් 12ක් ඇති බව
- සෑම ගොඩ සරඹයක් සඳහාම සරඹ නාමයක් පවතින බව
- ලය තුනට අභ්‍යාස කරන බව
- ගොඩ සරඹ නර්තනයේ දී ගැටබෙරය සහ තාලම්පට වාදනය කරන බව
- ගොඩ සරඹ නර්තනයේ දී මුළු ශරීරයම යොදා ගන්නා බව
- ගොඩ සරඹ ත්‍රිවිධ ලයේ අභ්‍යාස කිරීම තුලින් නර්තන කුසලතා වර්ධනය කර ගත හැකි බව

කරුණු **හතරක්** ලියා තිබේ නම්, ලකුණු 04 යි.
තුනක් විස්තර කර ඇත්නම් මුළු ලකුණු 4×3= 12යි.

04. i. ආඝාතාත්මක
චාමර, ගොයම්, කල, සවරම්, කුළු ................ ආදී වශයෙන් දෙකක් සහ
අනාඝාතාත්මක
පතල්, පාරු, පැල් කවි, කරත්ත කවි ................ ආදී වශයෙන් දෙකක් නම් කිරීම
ආදී වශයෙන් නම් කිරීම ලකුණු 03 යි.

ii.

- කතෘ කෙනෙක් නොමැතිකම
- ජනතාව අතරේම ඇති වී ඔවුන් අතරේම ආරක්ෂාවී පවතින ජනකවි විශේෂයක් බව
- ජනකවි තුලින් ඔවුනගේ ජීවන තොරතුරු,ඇදහිලි හා විශ්වාස පිළිබිඹු වන බව
- උදාහරණ දක්වමින් විස්තර කිරීම

කරුණු **තුනක්** යටතේ හැඳින්වීම ලකුණු 03 යි.

iii. නාටකය සොකරි

- චරිතය සොකරි බව
- පිරිමි ශිල්පියෙකු නර්තනයේ යෙදෙන බව
- ඔසරියක් ඇඳ කොණ්ඩය බැඳ ආභරණ පැළඳ වෙස් ගන්නා බව
- ලාලිත්‍යයෙන් යුක්තව, අනුරාගී හැසිරීම් වලින් යුක්ත බව
- කවි ගායනා කරමින් අනුකරණාත්මක රංගනයක යෙදෙන බව
- අතේ ලේන්සුවක් හෝ මල් පොකුරක් ඇති බව
- දෙං පි පි ගත තාලයේ කවි භාවිතා වන බව

ඉහත කරුණු **හතරක්** ඔස්සේ විග්‍රහ කිරීම ලකුණු 06 යි.

මුළු ලකුණු 3+3+6 = 12යි.

05. i. අතීත හේතුව - සේරමාන් රජුගේ හිසරුදාව සුව කිරීම සඳහා ල. 01යි.
වර්තමානයේ සශ්‍රීකත්වය, ලෙඩරෝග නිවාරණය, ස්වාභාවික විපත් වළක්වා ගැනීම, අධ්‍යාපනික කටයුතු සඳහා, සංරක්ෂණය සඳහා ල. 03යි.
ඉහත ආකාරයෙන් හේතු දැක්වීම ලකුණු 04 යි.

ii.

- පස්වලු එල්ලා සරසන ලද මඩුව, අයිලය, යක්ගෙය, යහන
- ගොක්කොළ, කෙසෙල් පතුරු, කෙසෙල් බඩ, පුවක් පටි, ඉනි පට්ටා යොදා ගන්නා බව

සැරසිලි නම් කිරීම ලකුණු 02යි. විස්තර කිරීම ලකුණු 02 යි. = 04 යි.

iii.

- සතුන් මැරීම ප්‍රාණඝාත අකුසලයක් බව
- වෛරය, ක්‍රෝධය, පලිගැනීම, ඉවසීමක් නැතිකම නරක විපාක දෙන බව
- දුරදිග නොබලා කටයුතු කිරීමෙන්, තීරණ ගැනීමෙන් ආත්ම ගණන් දුක් විඳින බව
- කිසියම් වැරදි ක්‍රියාවක් තමා සිදු කිරීමත්, අණ කිරීමත් වෙනත් අයකු ලවා කරවීමත් විපාක ගෙන දෙන්නක් බව

ඉහත කරුණු ඔස්සේ විග්‍රහ කිරීම ලකුණු 04 යි.
මුළු ලකුණු 4×3= 12යි.

06. i. A - වෙංගිලම් B - මද්දලය C – කුම්භු නම් කිරීම ලකුණු 03 යි.

ii. කථකලී නර්තන සම්ප්‍රදාය නම් කිරීම ලකුණු 01 යි.

- කථකලී නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන අවනද්ධ වාද්‍ය භාණ්ඩය වීම
- හැඩයෙන් සබරගමු දවුලට සමාන වීම
- උඩුකුරුව සිටින සේ උරයෙහි එල්ලාගෙන උඩුකුරු මූණතට ලී කෝටු දෙකකින් වාදනය කරන බව

කරුණු දෙකක් යටතේ හැඳින්වීම ලකුණු 02 යි.

මුළු ලකුණු = 03 යි.

iii.

- මිනික්කු - ඔප දමන ලද අරුත දෙන බව, මෙය මෙහි සාමාන්‍ය වේෂ නිරූපණ ක්‍රමය බව, කහ, රතු වර්ණ මූලික වේ.

  පච්චා - කොළ පැහැය වැඩියෙන් භාවිතා වෙන බව, ඉන්ද්‍ර, ක්‍රිෂ්ණා, රාම වැනි දේව චරිත සඳහා යොදා ගනී.
  කත්ති -මානාධික දරුණු චරිත, චරිත සඳහා යොදාගන්නා බව, පිහිය යන අරුත ගැබ් වී ඇති බව.
  තාඩි -රැවුල් වර්ගයක් බව, සුදු, කළු, රතු රැවුල භාවිතා වන බව, සෘෂි, බ්‍රාහ්මණ චරිත සඳහා යොදා ගැනේ.
  කාරි - හාස්‍ය රසෝත්පාද ගණයට අයත් චරිත සඳහා මෙම ක්‍රමය යොදා ගන්නා බව.
  ඩෙප්පු - නර්තන ශිල්පියා විසින් කරනු ලබන මූලික අංග රචනය බව.
- ඤෝරිනම් සාය හා කුප්පායම් හැටියට අඳින බව.

ඉහත කරුණු වලින් තුනක් සඳහා ලකුණු 06 යි.

මුළු ලකුණු 3+3+6 = 12යි.

07. i. ඉදිරියට ගෙන යාම

අභි - ඉදිරිය , නය - පැමිණවීම - ඉදිරියට පැමිණවීම

ලකුණු 02 යි.

ii.

- සතර අභිනයෙන් එකක් බව
- අංග චලනය මගින් ප්‍රකාශනය සිදු කරන බව
- අංග, උපාංග, ප්‍රත්‍යාංග යන ශාරීරික කොටස් උපයෝගි කොටගෙන අදහස් ප්‍රකාශ වන බව
- ඇත කෙනෙකුට ඇමතීම, නෑ, බෑ, එපා ආදී අවස්ථා අංග චලනයෙන් දැක්විය හැකි බව

ඉහත කරුණු යටතේ හැඳින්වීම - ලකුණු 04 යි.

iii.

- සතර අභිනය ලෙස වාචික, ආංගික, ආහාර්‍ය, සාත්වික අභින දැක්වීම
- නර්තන නිර්මාණයක් සාර්ථක වීම සඳහා
  වාචික අභිනයෙන් - ගායනා
  ආංගික අභිනයෙන් - චලන ඇතුළත් නර්තනය (අංගහාර)
  ආහාර්‍ය අභිනයෙන් - ඇඳුම්, පැළඳුම්, අංග රචනය, විදුලි ආලෝකය
  සාත්වික අභිනයෙන් - ප්‍රසන්න බව (මුහුණෙහි)

- නර්තන නිර්මාණයන්හි සාර්ථකත්වය සඳහා ඉහත අභින යටතේ පැහැදිලි කිරීම ලකුණු 06 යි.



**සැකසුම - ජේ.එම්.කේ. ජයකොඩි මිය.**
**අ/තම්මැන්නාව වේළුසුමන ම.වි, සීප්පුකුලම**